**ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය වාණිජ දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 295 - වාණිජ දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින දෙපාර්තමේන්තුවේ වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම්කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබෙන බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරිගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.1 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේ දී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවල දී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | අනුකූල නොවීම. | 2.5 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.4 (ආ) |

| | | | |
|---|---|---|---|
| 128(1)(ළ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | කළමනාකරණ දුර්වලතා | 2.2 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

----------------------------------------------

### 2.1 කාර්යසාධනය

---------------

විදේශ වාණිජ නියෝජන පිළිබඳව වාණිජ නිලධාරීන් විසින් සිදුකරන ලද පහත සඳහන් ක්‍රියාකාරකම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. ඒ අනුව ශ්‍රී ලංකාව තුල දේශීය හා විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කරගැනීම සඳහා වාණිජ නිලධාරින්ගේ සෘජු මැදිහත්වීම මත සංචාරක අවස්ථා හඳුන්වාදීමේ අවශ්‍යතාවය පැවතුණි.

| **ක්‍රියාකාරකම** | **ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩුවීම සියයට** |
|---|---|
| ප්‍රවර්ධන සල්පිල් සඳහා ශ්‍රී ලංකාව වෙත සත්කාරක රටෙහි වැඩසටහන් පැවැත්වීම් | 24 |
| ශ්‍රී ලංකාව වෙත දූත පිරිස් පැමිණීම | 39 |
| සත්කාරක රට වෙත පුද්ගල සංචාරයන් | 8 |
| ශ්‍රී ලංකාව වෙත පුද්ගල සංචාරයන් | 17 |

### 2.2 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1949 අංක 06 දරන උකස් පනත, 1947 අංක 12 දරන භාරකාර ආඥාපනත හා 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත යටතේ ණය දෙන සමිති අනුමත කිරීමේ කමිටුවේ නිර්දේශය මත ණය දෙන ආයතන ප්‍රකාශයට පත් කිරීමේ බලය වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පැවරී ඇත. උකස් පනතේ 114 ( 1 ) වගන්තිය යටතේ, ණය දෙන ආයතන අනුමත කිරීම හා නිර්දේශ කිරීම සඳහා අදාල අමාත්‍යවරයා විසින් සභාපති සහ සාමාජිකයන් දෙදෙනකු ඇතුලත් කමිටුවක් පත් කළ යුතු අතර එම පත්කිරීම ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කළ යුතු වේ. 2014 පෙබරවාරි 28 දිනැති ගැසට් නිවේදනය මගින් එම කමිටුව 2014 ජනවාරි 13 සිට 2017 ජනවාරි 12 දක්වා කාලයට පත්කර තිබූ අතර නැවත එම කමිටුව පත්කර තිබුණේ 2017 ජූනි 13 දින සිට 2020 ජූනි 12 දින දක්වා වූ කාලය සඳහා විය. ඒ අනුව 2017 ජනවාරි 13 දින සිට 2017 ජූනි 12 දක්වා වූ කාලයට කමිටුවක් නොතිබුණු අතර එමගින් වාණිජ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා තිබූ ණය දෙන ආයතන අනුමත කිරීමේ කාර්යය ඉටුකිරීම කර නොතිබුණි.

(ආ) 1973 සැප්තැම්බර් සිට 2017 අප්‍රේල් දක්වා උකස් පනතේ 114(1) වගන්තිය යටතේ ණය දෙන ආයතන 375 ක් එම පනතේ කාර්යයන් සඳහා අනුමත කල ණය දෙන ආයතන බවට දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර තිබුණි. එයින් ආයතන 269ක් සමූපකාර සමිති හා ග්‍රාමීය බැංකු වන අතර ඉතිරි ආයතන 106 මූල්‍ය සමාගම් හා බැංකු ආයතන විය. මෙම ණය දෙන ආයතන අනුමත කිරීම පමණක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර

අනුමත ණය දෙන ආයතනවල ක්‍රියාකාරීත්වය පිළිබඳව අධීක්ෂණයක් සිදුකිරීමේ ක්‍රමවේදයක් 2018 අගෝස්තු 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. පොදු මහජනතාවගේ මුල්‍ය ආරක්ෂාව පිණිස ණය දෙන ආයතන අධීක්ෂණය කිරීමේ ක්‍රමවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මහජනයා වංචනික කටයුතුවලට ගොදුරු වීමේ අවධානමක් පැවති බව නිරීක්ෂණය විය..

(ඇ) වරණීය වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු රහිතව භාණ්ඩ අපනයනය කිරීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රභවස්ථාන සහතික, රජයේ මුද්‍රණාලය මගින් දිය සලකුණ සහිතව ආරක්ෂිත අයුරින් මුද්‍රණය කරනු ලබයි. හිස් ප්‍රභවස්ථාන සහතික විෂය ලිපිකරු වෙත ලැබීමෙන් පසු අපනයනකරුවන් වෙත ඒවා ලබා දෙන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලිය සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලනය දුර්වල මට්ටමක පැවතුණි.

(ඈ) අපනයනකරුවන්ගේ අවශ්‍යතාවය අනුව එක් වරකට විශාල ප්‍රමාණයෙන් හිස් සහතිකපත් දෙපාර්තමේන්තුව විසින් නොමිලේ නිකුත් කරනු ලබයි. නමුත් එම නිකුත් කරනු ලැබූ හිස් සහතිකපත් නැවත දෙපාර්තමේන්තුව වෙත පැමිණ ප්‍රභවස්ථාන සහතික ලෙසින්ම ආපසු නිකුත් වීම සම්බන්ධයෙන් කිසිදු සැසඳීමක් සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් නිකුත් කල හිස් සහතික පත් හා ප්‍රභවස්ථාන සහතිකපත් අතර නොසැසදීම් නිරීක්ෂණය විය.

(ඉ) වාණිජ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුල වෙළඳ ගිවිසුම් යටතේ ප්‍රභවස්ථාන සහතික නිකුත් කිරීම ප්‍රධාන කාර්යයක් වශයෙන් දක්වා එම සහතික පත් නිකුත් කිරීමේ වගකීම විධායක සේවා ගණයට අයත් තනතුරු (සහකාර අධ්‍යක්ෂක/ නියෝජ්‍ය අධ්‍යක්ෂක - වාණිජ) වලට අදාල කාර්යභාරයන් ලෙස බඳවා ගැනීම් පරිපාටිය මත ඇතුලත් කර තිබුණි. එහෙත් දෙපාර්තමේන්තුවේ ද්විතීයික මට්ටමේ තනතුරක් වන සංවර්ධන නිලධාරී සේවයේ නියුක්ත ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් විසින් ප්‍රභවස්ථාන සහතික පත් නිකුත් කිරීමේ කාර්යය සිදු කරන බව නිරීක්ෂණය විය.

**2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ වාණිජ දෙපාර්තමේන්තුව සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 95.98 | 92.64 | 3.34 | 3.48 |
| | මූලධන | 11.43 | 8.97 | 2.46 | 21.52 |
| | **එකතුව** | **107.41** | **101.61** | **5.80** | **5.40** |
| 2014 | පුනරාවර්තන | 92.25 | 91.79 | 0.46 | 0.50 |
| | මූලධන | 14.75 | 13.23 | 1.52 | 10.31 |
| | **එකතුව** | **107.00** | **105.02** | **1.98** | **1.85** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2015 | පුනරාවර්තන | 105.65 | 96.00 | 9.65 | 9.13 |
| | මුලධන | 16.25 | 12.14 | 4.11 | 25.29 |
| | **එකතුව** | **121.90** | **108.14** | **13.76** | **11.29** |
| 2016 | පුනරාවර්තන | 110.29 | 109.13 | 1.16 | 1.05 |
| | මුලධන | 10.50 | 10.12 | 0.38 | 3.62 |
| | **එකතුව** | **120.79** | **119.25** | **1.54** | **1.27** |
| 2017 | පුනරාවර්තන | 122.30 | 115.77 | 6.53 | 5.33 |
| | මුලධන | 14.37 | 13.17 | 1.20 | 8.35 |
| | **එකතුව** | **136.67** | **128.94** | **7.73** | **5.65** |

**(අ) විසර්ජන ගිණුම**

-----------------

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

----------------------------

මූලධන වැය විෂයයක 3 ක හා පුනරාවර්ථන වැය විෂයයන් 08 ක එකතුව රු.මිලියන 4.52 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 9.23 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය, සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 98 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

---------------------------------------

දෙපාර්තමේන්තුවේ අදාල විෂය අංක 29501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.00 | 5.97 | 3.00 | 3.98 | 20.00 | 13.54 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත්වල දැක්වෙන ශේෂය හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂය අතර 2005 වර්ෂයේ සිට පැවත එන රු.416,550 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 19 දින විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ රු. 131,150ක ණය ශේෂය 2017 දෙසැම්බර් 31 දින දක්වා අයකර ගැනීමට නොහැකිවී තිබුණි.

## 2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2013 ජූලි 12 දිනැති හා අංක එස්ජ්/ජ්එස්/ජ් /චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන 05 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තක්සේරු කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා නිකුත් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

## 2.7 තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘ න්‍යාය පත්‍රය ’’ ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව වාණිජ දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව දැනුවත් වීම මත වාණිජ දෙපාර්තමේන්තුව විසින් සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර චක්‍රලේඛ, මගපෙන්වීම් නිකුත් කර නොතිබුණි. දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ක්‍රමවේදයක් නොපැවතුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 66 | 58 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | 00 |
| (iii) | ද්විතියික මට්ටම | 62 | 45 | 17 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 21 | 15 | 06 |
| | එකතුව | 151 | 120 | 31 |

====== ====== ======

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ කටයුතු සඳහා පහසුකම් සලසන ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ කටයුතුවලදී වැදගත් වන අතිරේක වාණිජ අධ්‍යක්ෂ ජනරාල් තනතුර හා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I තනතුර ඇති කළ දින සිට එනම් 2014 ජුනි 25 දින සිටද, පුස්තකාලයාධිපති තනතුර 1999 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2017 සැප්තැම්බර් 25 දින දී අනුමත කර ගන්නා ලද නීති නිලධාරී හා ආර්ථික විශේෂඥ යන තනතුරු දෙකම 2018 අගෝස්තු 31 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට නියෝජ්‍ය/සහකාර වාණිජ අධ්‍යක්ෂ තනතුරු 3 ක්, සංවර්ධන නිලධාරී තනතුරු 5 ක් , කළමනාකාර සහකාර තනතුරු 11 ක් හා කාර්යාල කාර්ය සේවයේ තනතුරු 4 ක් ද පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය. 2018 වර්ෂයේදී සංවර්ධන නිලධාරීන් තිදෙනෙකු හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි.